වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசனத் திணைக்களம்
**IRRIGATION DEPARTMENT**
(HYDROLOGY AND DISASTER MANAGEMENT DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation } 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125
ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත,කොළඹ07,ලංකාව / 230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை,கொழும்பு 07,இலங்கை / 230, P.O. Box 1138, BauddhalokaMawatha, Colombo 07, Sri Lanka

දුරකථනය(පොදු) / தொலைபேசி(பொது) / Telephone(General) } 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெய்ல் முகவரி / E-mail Address } ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site } www.irrigation.gov.lk

මගේ අංකය / எனது இல / My No. } **DI/Hydro/103(V)**

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திக / Date } **2024/06/03**

**Time :- 2.00 AM**
**වේලාව :- පෙ.ව. 2.00**

2024.06.05 දින පෙ.ව 2.00 දක්වා වලංගුවේ.
Valid till 2.00 AM on 05th of June 2024

| | | |
|---|---|---|
| **ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන :** | අංක **02** | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number 02** | Colour – Amber |

## <u>නිල්වලා ගඟ ද්‍රෝණිය - Nilwala Ganga Basin</u>

නිල්වලා ගඟ ද්‍රෝණියේ **පස්ගොඩ, කොටපොල, පිටබැද්දර, අකුරැස්ස, අතුරලිය, මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ, දෙවිනුවර සහ මාතර** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල නිල්වලා ගඟ පිටාර තැන්නට අයත් පහත් බිම් ප්‍රදේශවල පවතින ගංවතුර තත්ත්වය **පස්ගොඩ, කොටපොල, පිටබැද්දර හා අකුරැස්ස** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ඉහල පහත්බිම් වලදී ක්‍රමයෙන් අඩුවෙමින් පවතින අතර **අතුරලිය, මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ, දෙවිනුවර සහ මාතර** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් පහත්බිම් වලදී අද දිනය අවසන් වන තෙක්ම තවදුරටත් වර්ධනය වෙමින් පැවතීමේ ඉහල සම්භාවිතාවක් පවතින බව දැනුම් දෙනු ලැබේ. තවද පහල ප්‍රදේශවලදී ගඟේ ජලමට්ටම තවදුරටත් වර්ධනය වෙමින් පවතින බැවින් තවත් පැය 2ක පමණ කාලය තුල ගල් බන්ඩ් එක නමින් හඳුන්වන BR 5 බැම්ම සුළු වශයෙන් උතුරා යාමේ වැඩි ඉඩකඩක් ඇත. එසේ වුවද නිල්වලා ගංවතුර ආරක්ෂිත බැමි වලින් ආරක්ෂිත ප්‍රදේශවල සැලකිය යුතු ජල ප්‍රමාණයක් මේ වන විට රැඳී නොමැති බැවින් එසේ උතුරා ගලා එන ජලයෙන් එම ගංවතුර ආරක්ෂිත බැමි වලින් ආරක්ෂිත ප්‍රදේශවලට සැලකිය යුතු ගංවතුර බලපෑමක් ඇති වීමේ හැකියාව අවම වේ.

**කෙසේ වුවද නිල්වලා ගඟෙහි ගංවතුර තත්ත්වය සම්බන්ධයෙන් ඉහත සඳහන් කරන ලද සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නිල්වලා ගඟ පිටාර තැන්නට අයත් පහත් බිම් ප්‍රදේශවල පදිංචි ජනතාව සහ ඒ හරහා ගමන් කරන මගීන් හා රථවාහන රියදුරන් දැඩි අවධානයෙන් ක්‍රියා කළ යුතු බව ඉල්ලා සිටින අතර ආපදා කළමණාකරන අංශ හා දිස්ත්‍රික් පරිපාලන අංශ විසින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරන ලෙසද ඉල්ලා සිටිනු ලැබේ.**

Eng. S.P.C. Sugeeshwara
Director of Irrigation
(Hydrology & Disaster Management)
Irrigation Department
230, Bauddhaloka Mawatha,
Colombo - 07

**ඉංජි. එස්.පී.සී. සුගීශ්වර**
වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ)